මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: CGO/ASM/Policy/Cir/VOL-II
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 30.04.2024

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024**

**සියලුම: අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්**
**රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**
**රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්**

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - වාහනවල වටිනාකම තක්සේරු කිරීම**

රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, 02/2019 සහ 05/2021මගින් නිකුත් කර ඇත. වාහනවල වටිනාකම තක්සේරු කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛවල සඳහන් අදාල විධිවිධාන පහත සඳහන් පරිදි යෝග්‍ය ලෙස සංශෝධනය කර ඇතුළත් කරනු ලැබේ. ඒ අනුව, සියලුම ආයතන ප්‍රධානීන් විසින් පහත සඳහන් උපදෙස් අනුගමනය කර, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කිරීම මඟින් ක්‍රියාත්මක කර ඇති මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) තුල වාහනවල වටිනාකම වාර්තා කළ යුතු වේ:

1.1 ඉහත සඳහන් චක්‍රලේඛ උපදෙස් පරිදි වාහනවල වටිනාකම දැනටමත් තක්සේරු කර ඇත්නම් එම වටිනාකම NFAMS තුල වාර්තා කළ හැකි වේ.

1.2 2024 මැයි 15 දින සිට වාහනවල වටිනාකම් තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා පිළිවෙල අනුගමනය කළ යුතු වේ:

**අ. රජයේ ආයතන (ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හැර) සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන**

1.2.1 සෘජු මිලදී ගැනීමේ ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

1.2.1.1 මිලදී ගත් දින සිට පළමු වසර පහක කාලය තුලදී:

එවැනි සාමාන්‍ය වාහන (කාර්, වෑන්, කැබ්, බස් හා යතුරු පැදි ආදිය) හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරන වාහන (දුම්රිය, නැව් හා ගුවන් යානා ආදිය) සඳහා, මිලදී ගත් පිරිවැය හා වාහනය ධාවන තත්වයට පත්කිරීමට දරන ලද අදාල අනෙකුත් වියදම්වල එකතුව තක්සේරු වටිනාකම ලෙස ගත යුතු වේ.

1.2.1.2 මිලදී ගත් දින සිට පළමු වසර පහක කාලයට පසු කාලය තුළදී:

අ) එවැනි සාමාන්‍ය වාහනවල වටිනාකම තක්සේරු කිරීම, විධායක නිලධාරියෙකු හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකු ඇතුළත්ව ආයතන ප්‍රධානියා විසින් පත්කරනු ලබන සමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් කමිටුවක් මගින් සිදු කළ යුතු වේ.

ආ) එවැනි විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල වටිනාකම තක්සේරු කිරීම, විධායක නිලධාරියෙකු හා එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීමට අදාල විශේෂ දැනුමක් ඇති නිලධාරියෙකු ඇතුළත්ව ආයතන ප්‍රධානියා විසින් පත්කරනු ලබන සමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් කමිටුවක් මගින් සිදු කළ යුතු වේ.

1.2.2 මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

මෙම වාහනවල අයිතිය රජය සතු වන බැවින්, එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීම අවශ්‍ය වේ:

අ) එවැනි සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල, මිලදී ගත් දින සිට පළමු වසර පහක කාලය තුල වටිනාකම තක්සේරු කිරීම සඳහා, එකඟ වූ මුළු මූල්‍ය කල්බදු වටිනාකම තක්සේරු වටිනාකම ලෙස ගත යුතු වේ.

ආ) එවැනි සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල, මිලදී ගත් දින සිට පළමු වසර පහෙන් පසු කාලය තුලදී වටිනාකම තක්සේරු කිරීම සඳහා, ඉහත 1.2.1.2 වගන්තිය යටතේ වන ක්‍රමවේදය අනුගමනය කළ යුතු වේ .

1.2.3 මෙහෙයුම් කල්බදු ක්‍රමය/ කුලී පදනම යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

මෙම වාහනවල අයිතිය රජය සතු නොවන බැවින්, එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීම අවශ්‍ය නොවේ.

**ආ. ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල**

1.2.4 ඍජු මිලදී ගැනීමේ ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

1.2.4.1 මිලදී ගත් දින සිට පළමු වසර දහයක කාලය තුලදී:

එවැනි සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා, මිලදී ගත් පිරිවැය හා වාහනය ධාවන තත්වයට පත්කිරීමට දරන ලද අදාල අනෙකුත් වියදම්වල එකතුව එම මිලදී ගැනීම සිදු කළ දිනයේ පැවති අදාල ව්‍යවහාර මුදල් විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලැබූ ශ්‍රී ලංකා රුපියල් අගය, තක්සේරු වටිනාකම ලෙස ගත යුතු වේ.

1.2.4.2 මිලදී ගත් දින සිට පළමු වසර දහයක කාලයට පසු කාලය තුලදී:

NFAMS හි වාර්තා වන තොරතුරු අනුව, එවැනි සාමාන්‍ය වාහන හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහන පවතී නම්, එවැනි වාහනවල වටිනාකම වාර්තා කිරීමේදි කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් සුදුසු සටහන් යෙදීම සිදු කරනු ඇත.

1.2.5 මුල්‍ය කල්බදු ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

මෙම වාහනවල අයිතිය රජය සතු වන බැවින්, එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීම අවශ්‍ය වේ:

අ) එවැනි සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල, මිලදී ගත් දින සිට පළමු වසර දහයක කාලය තුළදී වටිනාකම තක්සේරු කිරීම සඳහා, එකඟ වූ මුළු මුල්‍ය කල්බදු වටිනාකම එම මිල දී ගැනීම සිදු කළ දිනයේ පැවති අදාල ව්‍යවහාර මුදල් විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරනු ලැබූ ශ්‍රී ලංකා රුපියල් අගය, තක්සේරු වටිනාකම ලෙස ගත යුතු වේ.

ආ) එවැනි සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල, මිලදී ගත් දිනයේ සිට පළමු වසර දහයෙන් පසු කාලය තුළදී වටිනාකම තක්සේරු කිරීම සඳහා, ඉහත 1.2.4.2 වගන්තියේ සඳහන් ක්‍රමවේදය අනුගමනය කරනු ඇත.

1.2.6 මෙහෙයුම් කල්බදු ක්‍රමය/ කුලී පදනම යටතේ ප්‍රසම්පාදනය කළ වාහන:

මෙම වාහනවල අයිතිය රජය සතු නොවන බැවින්, එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීම අවශ්‍ය නොවේ.

ඇ. රාජ්‍ය ව්‍යාපාර

1.2.7 සාමාන්‍ය වාහනවල හෝ විශේෂ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා, ඉහත 1.2.1, 1.2.2 සහ 1.2.3 වගන්තිවල සඳහන් ක්‍රමවේදය හෝ අදාල ආයතනය විසින් අනුගමනය කරනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්වල අදාල ප්‍රතිපාදන, සුදුසු පරිදි අදාල කරගත හැකි වේ.

1.3 ඉහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින්, වාහනවල තක්සේරු වටිනාකම වසර පහකට වරක් යාවත්කාලීන කළ යුතු වේ. ඒ සඳහා, අදාල වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට වන වටිනාකම තක්සේරු කළ යුතු වේ. කෙසේ වුවද, වාහනයක වටිනාකමට සැලකිය යුතු වෙනසක් (වාහනයේ ආසන්නතම පූර්ව තක්සේරු වටිනාකමෙන් අඩුම වශයෙන් 25% ක) ඇති කරනු ලබන යම් සිදුවීමක් වේ නම්, අදාල වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට එම වාහනයේ වටිනාකම තක්සේරු කළ යුතු වේ. එවැනි අවස්ථාවලදී, වටිනාකම නැවත තක්සේරු කිරීම, ප්‍රායෝගික කරුණු අනුව, නව තක්සේරු වර්ෂයේ සිට වසර පහක් සම්පූර්ණ වන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හෝ නව තක්සේරු කිරීමට පෙරාතුවම වූ ආසන්නතම පූර්ව තක්සේරු කිරීමේ සිට වසර පහක් සම්පූර්ණ වනු ලබන වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට සිදු කළ හැකි වේ.

02. රජයේ මුල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරීම අනිවාර්ය කාර්යක් වන බැවින්, පහත සඳහන් ගෙවීම් පමණක් කළ හැකි වේ:

2.1 ඉහත 1.2.1.2 (අ) වගන්තියට අදාල කමිටුව සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් සහභාගී වන පරීක්ෂකවරයා සඳහා:

අ) නිශ්චිත වර්ෂය තුළදී වටිනාකම තක්සේරු කිරීම සඳහා ආයතනයක පවතින වාහන සංඛ්‍යාව දහයක් හෝ ඊට අඩු වන්නේ නම්, එවැනි වාහනවල වටිනාකම තක්සේරු කිරීම එක් කමිටුවක් මගින් සිදු කළ යුතු අතර එම කමිටුවේ අවසන් වාර්තාව සඳහා රු.1,000 ක දීමනාවක්.

ආ) නිශ්චිත වර්ෂයක් තුලදී වට්නාකම තක්සේරු කිරීම සඳහා ආයතනයේ පවතින වාහන සංඛ්‍යාව දහයකට වඩා වැඩි වන්නේ නම්, එවැනි වාහනවල වට්නාකම තක්සේරු කිරීම සඳහා පත්කරනු ලබන අදාල කමිටුවල අවසන් වාර්තා ලබා දීමෙන් පසු එක් වාහනයක් සඳහා රු.100 ක් බැගින් වූ දීමනාවක්.

2.2 ඉහත 1.2.1.2 (ආ) වගන්තියට අදාල කමිටුව සඳහා අවශ්‍ය විශේෂ දැනුම සහිත නිලධාරියා සඳහා ආයතන ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන සුදුසු දීමනාවක්.

**අත්.කළෝ/ කේ.එම්.මහින්ද සිරිවර්ධන**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
6. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්
7. විගණකාධිපති